මැතිවරණ දෙපාර්තමේන්තුව
தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය :011-2868441, 2868442, 2868443
பொதுஅலுவலகம்

ෆැක්ස්/தொலைநகல்:011-2868426
*web :www.slelections.gov.lk* *e-mail : info@slelections.gov.lk*

මැතිවරණ මහලේකම්කාර්යාලය
සරණ මාවත, රාජගිරිය(10107)

தேர்தல்கள் செயலகம்,
சரணமாவத்தை, இராஜகிரிய(10107)

මගේඅංකය : DE/LI/**04**/**2015(PE)**
எனது இல.

ඔබේඅංකය :
உமது இல.

දිනය : 2015.07.05
திகதி

සියලුම තේරීම්භාර නිලධාරීන්,

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත

**පාර්ලිමේන්තු ඡන්ද විමසීම - 2015.08.17**

**මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා පළාත් පාලන ආයතනවලට අයත්**

**ක්‍රීඩා භූමි හා පොදු ස්ථාන වෙන් කිරීම**

2015.08.17 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු ඡන්ද විමසීමේ දී තරඟ කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල මැතිවරණ ප්‍රචාරක රැළි පැවැත්වීම සඳහා පළාත් පාලන ආයතනවලට අයත් පොදු ස්ථාන හා ක්‍රීඩා භූමි වෙන් කර දීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නියමය පරිදි අදාළ සියලුම පාර්ශ්වයන්ගේ එකඟතාවෙන් සකස් කරන ලද වැඩ පිළිවෙල මේ සමඟ ඔබ වෙත එවමි.

02. පොදු ස්ථාන හා ක්‍රීඩා භූමි, දේශපාලන ප්‍රචාරක රැළි සඳහා වෙන් කිරීමේ දී මෙම උපමාන අනුව කටයුතු කරන ලෙස දන්වන අතර, මෙම වැඩපිළිවෙල පිළිබඳව පළාත් පාලන කොමසාරිස්, සියලුම පලාත් පාලන ආයතන ප්‍රධානීන්, ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් දේශපාලන පක්ෂවල ප්‍රාදේශීය නියෝජිතයන් හා ක්‍රියාකාරීන් දැනුවත් කරන ලෙස ද කාරුණිකව දන්වමි.

03. එමෙන්ම ඔබ දිස්ත්‍රික්කයට අදාළව සකස් කරන ලද දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කමිටුවල විස්තර නොපමාව අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන) වෙත එවීමට ක්‍රියා කරනු මැනවි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පිටපත්:
01. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) - දැන ගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා කරුණාවෙනි
02. සියලුම දේශීය නිරීක්ෂණ සංවිධාන - කාරුණික දැන ගැනීම සඳහා

## මැතිවරණ ප්‍රචාරණ රැළි සඳහා පළාත් පාලන ආයතනවලට අයත් ක්‍රීඩාභූමි හා පොදු ස්ථාන වෙන් කිරීම

පසුගිය මැතිවරණ හා ඡන්ද විමසීම්වල දී පළාත් පාලන ආයතන සතු ක්‍රීඩාභූමි හා වෙනත් පොදු ස්ථාන මැතිවරණ ප්‍රචාරක රැළි සඳහා වෙන් කිරීමේදී ඉමහත් ගැටළුකාරී තත්ත්වයන් ඇතිවිය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ද පැමිණිලි ඉදිරිපත් කර තිබූ අතර ඒ සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම අරමුණු කොට ගෙන දිවයිනේ සියලුම පළාත්වල පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් ඇතුළු ඊට අදාළ සෙසු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී.

මෙම සාකච්ඡාවේ දී ගනු ලැබූ තීරණ පදනම් කොට ගෙන පළාත් පාලන ආයතනවලට අයත් ක්‍රීඩාභූමි හා වෙනත් පොදු ස්ථාන තරඟ කරන ලද දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්/ අපේක්ෂකයන් අතර බෙදා දීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කර මානව හිමිකම් කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි ක්‍රියාත්මක කරවීම පිණිස අදාළ පාර්ශවයන් වෙත දැනුම් දීම සහ එම කටයුතු නියාමනය කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමට පත් කරනු ලැබූ කමිටුව 2015.05.22 දින මැතිවරණ දෙපාර්තමේන්තුවේ දී රැස්වී සාකච්ඡා කරන ලද අතර එහිදී පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන ලදී.

1. සෑම ඡන්ද විමසීමකදීම මැතිවරණ ප්‍රචාරණ කාලසීමාව තුළ දී මෙන්ම ඡන්ද විමසීම් සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම පළ කරනු ලබන දින සිට නාමයෝජනා භාර ගැනීමේ අවසන් වන දින තෙක් වූ කාල සීමාව තුළ ද මෙම යෝජනා ක්‍රියාවට නැංවීම කළ යුතුය. ජනමත විචාරණයකදී ජනමත විචාරණ දැන්වීම නිකුත් කළ දින සිට ප්‍රචාරණ කටයුතු අවසන් වන කාලසීමාව දක්වා මෙම යෝජනා බල පැවැත්විය යුතුය.

2. ජනමත විචාරණයක් හෝ ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව දිවයිනේ සියලුම (මැතිවරණ) දිස්ත්‍රික්ක පදනම් කර මැතිවරණ ප්‍රචාරණ රැළි සඳහා පළාත් පාලන ආයතන සතු ක්‍රීඩාභූමි හා වෙනත් පොදු ස්ථාන වෙන් කිරීම පිණිස අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ දිස්ත්‍රික් ලේකම්ගේ සභාපතිත්වයෙන් සහ පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත දිස්ත්‍රික් කමිටු පත් කළ යුතුය. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ දිස්ත්‍රික් ලේකම් කමිටුවට සහභාගී නොවන අවස්ථාවලදී දිස්ත්‍රික්කයේ අතිරේක දිස්ත්‍රික් ලේකම්වරුන් හෝ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/ සහකාර මැතිවරණ කොමසාරිස් කමිටුවේ සභාපති ධූරය දැරිය යුතු වේ.

   i. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ නියෝජිතයෙක්
   ii. දිස්ත්‍රික්කය භාර නියෝජ්‍ය පොලිස්පති/ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී හෝ පොලිස් අධිකාරී
   iii. දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/ සහකාර මැතිවරණ කොමසාරිස්
   iv. දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර පළාත් පාලන කොමසාරිස්
   v. අවශ්‍යතාව අනුව පළාත් පාලන ආයතනයේ නාගරික කොමසාරිස්/ නගර සභා/ ප්‍රාදේශීය සභා ලේකම්

3. නාමයෝජනා භාරදුන් දිනයේ සිට සතියක් ඇතුළත තරඟ කරනු ලබන සෑම දේශපාලන පක්ෂයකම පක්ෂයේ ලේකම්/ බලයලත් නියෝජිතයා විසින් ද, ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් ද ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී ස්වකීය දේශපාලන පක්ෂය/ ස්වාධීන කණ්ඩායම විසින් දිස්ත්‍රික්කය තුළ පැවැත්වීමට අපේක්ෂිත රැස්වීම් පිළිබඳ විස්තර අදාළ දිස්ත්‍රික් කමිටුවට ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා සුදුසු අයදුම්පතක් දිස්ත්‍රික් කමිටුව විසින් සකස් කළ යුතු අතර එම අයදුම්පතෙහි පහත සඳහන් විස්තර ද ඇතුළත් විය යුතුය. මීට අමතරව දිස්ත්‍රික් කමිටුව විසින් අවශ්‍ය යැයි හඳුනා ගන්නා විස්තර ද අයදුම්පතට ඇතුළත් කළ යුතුය.

   i. පළාත් පාලන ආයතනයේ නම:
   ii. ඉල්ලුම් කරන දේශපාලන පක්ෂය/ ස්වාධීන කණ්ඩායම/ අපේක්ෂකයාගේ නම:
   iii. ක්‍රීඩාභූමිය/ පොදු ස්ථානයේ නම සහ පිහිටි ස්ථානය:
   iv. එම ස්ථානය පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම:
   v. අවශ්‍ය වන දිනය, වේලාව හා කාලය:
   vi. පක්ෂ නායකයෙකු සහභාගී වන රැස්වීමක් නම් ඒ පිළිබඳ විස්තර:
   vii. වෙනත් අදාළ විස්තර:

4. තරඟ කරනු ලබන දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්/ අපේක්ෂකයන් විසින් පැවැත්වීමට නියමිත රැස්වීම් සඳහා අදාළ දිනයන් හා වේලාවන් වෙන් කර ගැනීම සම්බන්ධයෙන් මෙන්ම ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සඳහා පොලිසිය වෙතින් ලබාගනු ලබන අනුමැතිය සම්බන්ධයෙන් ද මෙම කමිටුවේ අවධානයට යොමු විය යුතුය.

5. පෞද්ගලික ස්ථානවල පවත්වනු ලබන රැස්වීම් සඳහා පොලිසිය මඟින් ලබාදෙනු ලබන ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සඳහා වූ අනුමැතිය ද ඉහත කමිටුවේ අවධානයට යොමු විය යුතුය.

6. එකම දිනයේ දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්/ අපේක්ෂකයන් දෙදෙනෙක් හෝ කිහිපදෙනෙකු විසින් එකම ස්ථානයක් වෙන් කර ලබාදෙන ලෙස ඉල්ලා සිටී නම් අදාළ පාර්ශවයන් හෝ නියෝජිතයන් කැඳවා සාකච්ඡා කර විකල්ප ස්ථානයක් ලබාදීමට හෝ දින දෙකකදී එම ස්ථානය ප්‍රචාරක රැළිය පැවැත්වීම සඳහා ලබාදීමට කමිටුව ක්‍රියා කළ යුතුය. ඉහත පරිදි කටයුතු කිරීමට අදාළ පාර්ශව එකඟ නොවන්නේ නම් කුසපත් ඇදීමක් මගින් අදාළ දිනයේ එම ස්ථානය වෙන් කර ලබාදෙන පාර්ශවය තීරණය කළ යුතුය.

7. මැතිවරණ ප්‍රචාරක කාලසීමාව තුළ දී පළාත් පාලන ආයතන සතු ක්‍රීඩාභූමි හා පොදු ස්ථාන වෙනත් විවිධ කාර්යයන් සඳහා වෙන් කර දෙන ලෙස කරනු ලබන ඉල්ලීම් හා මැතිවරණ ප්‍රචාරක රැළි සඳහා කරන ඉල්ලීම් අතුරින් ප්‍රමුඛත්වය ලබාදිය යුත්තේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා කරනු ලබන ඉල්ලීම්වලටය. මැතිවරණ ප්‍රචාරක රැළි සඳහා අදාළ ස්ථාන වෙන් කිරීමෙන් අනතුරුව අනෙකුත් ඉල්ලීම් පිළිබඳව සලකා බැලීම සුදුසුය.

8. ජාතික මට්ටමේ නායකයන් දිස්ත්‍රික් ප්‍රචාරක කටයුතුවලට සම්බන්ධ වන්නේ නම් ඒ සම්බන්ධයෙන් අදාළ දේශපාලන පක්ෂ ලේකම්වරුන්/ ස්වාධීන කණ්ඩායම් නායකයන් විසින් එම රැස්වීම් පැවැත්වෙන දින හා වේලාවල් ඇතුළත් කාලසටහනක් ද අදාළ දිස්ත්‍රික්කවල තම පක්ෂයේ/ ස්වාධීන කණ්ඩායමේ නියෝජිතයා මගින් ඉහත කමිටුව වෙත ලබාදීම කළ යුතුය.

9. කමිටුව වෙත ලැබෙන ඉල්ලීම් හා වෙනස් කිරීම් සලකා බැලීම සඳහා අවශ්‍යතාව අනුව කමිටුව රැස්ව තීරණ ගැනීම කළ යුතු වේ.

10. තරඟ කරනු ලබන සියලුම දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්/ අපේක්ෂක ඉල්ලීම් සඳහා සමාන අවස්ථාවන් ලැබෙන පරිදි සාධාරණ හා අපක්ෂපාතී ලෙස පළාත් පාලන ආයතනවලට අයත් ක්‍රීඩාභූමි හා පොදු ස්ථාන ලබාදීම මෙම කමිටුවේ වගකීම වේ.

11. මීට අමතරව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම අදාළව ප්‍රාදේශීය කමිටුවක් පිහිටුවන ලෙස ද යෝජනා කරනු ලැබේ. එම කමිටුව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය. එසේ වුවද යම් පළාත් පාලන ආයතනයක් ප්‍රාදේශීය ලේකම් කොඨාස කිහිපයකින් සමන්විත වූ විට එක් ප්‍රාදේශීය කමිටුවක් පිහිටුවීම ප්‍රමාණවත්ය.

    i. තේරීම්භාර නිලධාරියා විසින් නම් කරන ලද නියෝජිතයෙකු
    ii. නිල කාලය අවසන් නොවූ පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා හෝ නියෝජිතයෙකු
    iii. නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් හෝ නියෝජිතයෙකු
    iv. ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම්
    v. අදාළ පළාත් පාලන ආයතනයේ කොමසාරිස් හෝ ලේකම්
    vi. අදාළ පොලිස් ස්ථානාධිපති

12. තේරීම්භාර නිලධාරී විසින් පත් කරනු ලබන නියෝජිතයා මෙම කමිටුවේ සභාපතිත්වය දැරිය යුතු අතර, දිස්ත්‍රික් කමිටුවේ තීරණ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම මෙම කමිටුවේ ප්‍රධාන රාජකාරිය වේ. දිස්ත්‍රික් කමිටුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවන රැස්වීම් හා භූමි වෙන් කිරීම් පිළිබඳව මෙම කමිටුවට තීරණය කළ හැකි අතර තීරණය කිරීමට නොහැකි කරුණු දිස්ත්‍රික් කමිටුවට ඉදිරිපත් කළ යුතුවේ.